ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
දෙහිවල, සුදර්ශන පාරේ, ශ්‍රී සුදර්ශන ධම්ම නිකේතනයේ පිහිටි දෙහිවල බෞද්ධෝදය ස
මගින් ධර්ම දානම පිණිස සෑම පුර පසළොස්වක පොහෝ දිනයක්
පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.



# බෞද්ධෝදය

"ධම්මො හවේ රක්ඛති ධම්මචාරිං"

72වර්ෂය - ශ්‍රී බු.ව 2560 | 2017 පෙබරවාරි 10 | නවම් කලාපය

## ශාස්ත්‍රපති
## පූජ්‍ය උඩරුගමුවේ අස්සජි හිමි

## දියුණුවේ දොරටු

**කතමා ච ව්‍යග්ඝපජ්ජ උට්ඨාන සම්පදා? ඉධ ව්‍යග්ඝපජ්ජ කුලපුත්තො යෙන කම්මට්ඨානෙන ජීවතං කප්පෙති. යදි කසියා, යදි වණිජ්ජාය යදි ගෝරක්ඛෙන, යදි ඉස්සත්ථෙන, යදි රාජපොරිසෙන යදි සිප්පඤ්ඤතරෙන, තත්ථ දක්ඛො හොති. අනලසො තත්‍රුපාය විමංසාය සමන්නාගතො, අලංකාතුං අලං සංවිධාතුං, අයං වුච්චති ව්‍යග්ඝපජ්ජ උට්ඨාන සම්පදා**

බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවෙක කක්කරපත්ත නමැති කෝලිය ගමට වැඩම කලහ. එහිදී ව්‍යග්ඝපජ්ජ වංශික දීඝජානු නමැති කෝලිය පුත්‍රයා බුදුරදුන් හමුවීමට ගොස් එකත්පස්ව හිඳ මෙසේ පැවසීය.

''ස්වාමීනි, අපි පස්කම් සුව අනුභව කරමින් අඹුදරුවන් නිසා වන කරදර සහිතව ගිහි ගෙදර වාසය කරමු. කසී රට සුවඳ සඳුන් පරිභෝග කරමු. මල් ගඳ විලවුන් භාවිතා කරමු. රන් රිදී මසු කහවණු ඉවසමු. ස්වාමීනි, මෙසේ ජීවත්වන අපට මෙලොව හිත සුව පිණිස පරලොව හිතසුව පිණිස උපකාර වන්නා වූ ධර්මයක් දේශනා කරන සේක්වා! ''

මෙහිදී බුදුරජාණන් වහන්සේ මිනිසාගේ මෙලොව හිත සුව පිණිස පවත්නා කරුණු සතරක්ද, පරලොව හිත සුව පිණිස පවත්නා කරුණු සතරක්ද, දේශනා කලහ. එයින් මෙලොව හිත සුව පිණිස හේතුවන කරුණු සතර නම් උත්සාහ සම්පත්තිය (උට්ඨාන සම්පදා) ආරක්ෂා සම්පත්තිය (ආරක්ෂා සම්පත්තිය) (ආරක්ඛ සම්පදා) කල්‍යාණ මිත්‍රයන්ගේ ආශ්‍රය (කල්‍යාණ මිත්තතා) පමණ දැන සමව ජීවත්වීමයි. (සමජීවිකතා) මෙයින් ''උට්ඨාන සම්පදා'' යනු කුමක්දැයි, පහදමින් බුදුරදුන් දේශනා කළ පාඨයයි. ඉහත දැක්වූයේ, එහි සිංහල අර්ථය මෙසේය.

''ව්‍යග්ඝපජ්ජය උට්ඨාන සම්පදාව නම් කුමක්ද? මේ ලෝකයේ යම්කිසි කුලපුත්‍රයෙක් ගොවිතැනින් හෝ වෙළඳාමෙන් හෝ ගව පාලනයෙන් හෝ දුනු ශිල්පයෙන් හෝ රාජ්‍ය සේවාවෙන් හෝ වෙන යම්කිසි ශිල්පයකින් හෝ දිවි පවත්වය නම්, ඒ තමන් කරන කාර්යයෙහි දක්ෂ වෙයි ද, අලස නොවේද, ඒ කාර්යයෙහි උපායෙන් හා විමසීමෙන් යුක්ත වේද, එය කිරීමටත් සංවිධානය කිරීමටත් සමත් වේද, මෙය උට්ඨාන සම්පදා නම් වේ.

මේ අනුව මෙමගින් වඩාත් ඉස්මතු කොට පෙන්වා දී ඇත්තේ තමන් යම්කිසි ජීවන මාර්ගයකින් දිවිපෙවෙත ගෙන යන්නේද ඒ පිළිබඳ තමා,

01. දක්ෂ විය යුතුය. (තත්ථ දක්ඛො හොති)
02. අලස නොවිය යුතුය. (අනලසො)
03. එය උපායෙන් හා විමසීමෙන් කළ යුතුය. (තත්‍රූපායා වීමංසාය (සමන්නාගතො)
04. එය කිරීමටත්, සංවිධානය කිරීමටත් දක්ෂ විය යුතුය. (අලංකාතුං අලං සංවිධාතුං)

## දක්ෂ බව

කිසියම් කාර්යයක් සපල කරගැනීමට නම් ඒ පිළිබඳ දක්ෂකමක් තිබිය යුතුමය. කෘෂි කර්මාන්ත, වෙළඳාම රාජ්‍ය සේවය යනාදී, ඒකියාවක නිරතවන්නා එකී කර්මාන්තය පිළිබඳව දක්ෂ විය යුතුය. දක්ෂතාව ඇති වන්නේ ඒ පිළිබඳ ඇති ඇල්ම, දැනුම, ක්‍රියා කෞශල්‍යය ආදී කරුණු හේතු කොට ගෙනය. ලෝකයේ ඇතැම්හු උත්පත්තියෙන්ම යම් යම් දේට දක්ෂ වෙති. සංසාර පුරුද්ද එයට හේතුව යැයි, සිතිය හැකිය, එසේ නොමැති වුවත් අධිෂ්ඨාන ශක්තියත් ඇති පුද්ගලයාට අවශ්‍ය ඒ ඒ ක්‍රියාවන් කෙරෙහි දක්ෂකමක් ඇති කරගත හැකිය. මිනිසා තුළ ඇති ක්‍රියා ශක්තිය ඉතා විශාලය. එහෙත් බොහෝ දෙනා එයින් ප්‍රයෝජන ගනුයේ ඉතා අල්ප වශයෙනි, තමා තුළ පිහිටි ක්‍රියා ශක්තියෙන් නියම අයුරින් ප්‍රයෝජන ගන්නේ නම් ඕනෑම පුද්ගලයෙකුට දියුණු විය හැකිය. එසේම තමා තුළ ඇත්තේ කවර දේකට අදාළ දක්ෂකමක් දැයි, යන්න හොඳින් තේරුම් ගෙන කෙනෙකුට දියුණු විය හැකිය. එක් එක් පුද්ගලයා තුළ ඇත්තේ එක් එක් දේ පිළිබඳ දක්ෂකමෙකි. බොහෝ දේ පිළිබඳ දක්ෂකම් ඇත්තෝ ඉතා විරලයහ. ''ලොවින් එකෙක් එක් දෙයකට වෙයි සමත'', යැයි, අපේ පරණ කියමනක් ඇත්තේ එහෙයිනි. එසේ හෙයින් තමා තුල ඇති දක්ෂකම තෝරාගෙන ක්‍රියා කිරීම තමන් සතුකාර්යයකි. මේ අනුව උට්ඨාන සම්පදා ඇතිකර ගැනීමට දක්ෂබව බෙහෙවින්ම හේතුවන බව පැහැදිලිය. අදක්ෂ පුද්ගලයා මෙලොව හා පරලොව යන දෙඅංශයෙන්ම පිරිහීමට පත් වේ. කරණිය මෙත්ත සූත්‍රයෙහි ''සක්කො'' යන්නෙන් අදහස් වන්නේ ද මෙම දක්ෂ බවයි.

## අනලසබව

උට්ඨාන සම්පදා ඇති කර ගැනිමට අවශ්‍ය අනෙක් කරුණ නම් ''අනලසබව'' යි. එනම් කම්මැලි නොවීමයි. පරාභව සූත්‍රයේදී අලසබව පිරිහිමේ කරුණක් ලෙස බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්හ. සිගාලෝවාද සූත්‍රයේදී මෙහි ආදීනව මෙසේ වදාලහ.

දැන් ඉතා ශීතය. ඉතා උෂ්ණය. ඉතා සවස්ය. ඉතා උදේය. ඉතා බඩගිනිය. ඉතා බඩ පිරුනේ යයි, වැඩ නො කරන්නා ගේ ධනය පිරිහෙයි, අමුතු ධනයකුදු ඇති නොවෙයි. මෙසේ අලසකමින් සිතන්නාට වැඩ කිරීමට කාලයක් නොමැත.

උත්සාහවත් පුද්ගලයාට සිදු කළ නොහැකි දෙයක් නැති බව **''උට්ඨානවතො භික්ඛවෙ කිං නාම න සිජ්ඣති''** යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කලහ. මෙම වීර්යයට විරුද්ධ ධර්මය ''ථීන මිද්ධය'' යි. එනම් චිත්ත චෛතසිකයන්ගේ මැලිබවයි.

## උපායෙන් හා විමසීමෙන් යුක්ත වීම

උට්ඨාන සම්පදා ඇති කර ගැනිමට අවශ්‍ය තෙවැනි කරුණ ලෙස මෙය දැක්විය හැකිය. කර්ම විපාකයේදී බලපාන බාහිර කරුණු සතර අතර ''ප්‍රයෝගය'' ද එකකි. ප්‍රයෝගය යනු උපායයි. ''උපාය දන්නෝ අපායේ නොවැටෙති.'' යන පිරුළ ඇති වුයේ ඒ නිසා විය යුතුය. මෙලොව දියුණුවට අවශ්‍ය ගොවිතැන්, වෙළඳාම් ආදී දේ දියුණුකර ගැනීමට උපායෙහි දක්ෂ බව ඇති විය යුතුය. මිථ්‍යා උපාය (වැරදි උපාය) සහ සම්මා උපාය (නිවැරදි උපාය) යනුවෙන් උපාය මාර්ග දෙකක් ඇති බව ද මෙහි දී වටහාගත යුතුය. මින් අනුන්ට පීඩා පමුණුවන වැරදි උපාය මාර්ගයන් සහ මුලින්ම බැහැර කළ යුතුය. නිවැරදි උපාය මාර්ග පමණක් භාවිතයට ගත යුතුය. කිසාගෝතමියට කිසිවෙකු නොමල ගෙයකින් අබ මිටක් ගෙන්නෙන්, බුදුරදුන් වදාලේ සම්‍යක් උපාය මාර්ගය මුල් කරගෙනය. එනම් තමා පත්ව ඇති තත්වය තමාටම තේරුම් ගැන්මට ඉඩකඩ සැලසීමයි. ලෞකික රාජ සම්පත් සියල්ල අත්හැර අභිනිෂ්ක්‍රමණය කොට බුද්ධත්වයට පත් වු බුදුරදුන් පිටුපස රාහුල කුමරු දායාද ඉල්ලා පිටත් කොට හැරියේ උන්වහන්සේ ලත් පරම සුවය ඔහුට ද ලබාදීමේ අපේක්ෂාවෙනි. යශෝධරා දේවිය බුදුරදුන් හට ලෞකික වශයෙන් දිය හැකි දායාද කිසිවක් නොමැති බව පැහැදිලිවම දන්නීය. සිය පුත් කුමරු ද ලෝකෝත්තර මාර්ගයට ඇතුළත් කිරිම සඳහා යශෝධරා දේවිය යෙදු සම්‍යක් උපායක් ලෙස පුත් කුමරු දායාද ඉල්ලා පිටුපස යැවීම දැක්විය හැකිය.

උපාය සමග විමසා බලා කටයුතු කිරීම ද අත්‍යාවශ්‍යය. නොවිමසා නොසිතා කටයුතු කරන්නා දියුණු නොවන බව බුදුරජාණන් වහන්සේ වදාළහ. කල්පනා ශක්තිය යෙදවීමක් නැතිව අවිචාරවත් ලෙස ක්‍රියා කරන්නා දෙලොවින්ම පිරිහෙයි. එය පැවිදි වුවහොත් රහත් වීමටත්, නිසි සේ ගිහි ජීවිතය ගත කළේ නම් මහ සිටු වීමටත් වාසනාව තිබියදී නොනිසි ලෙස ක්‍රියා කොට සිඟන්නෙකු බවට පත් වූ රජගහනුවර සිටාණන් ගේ කතාවෙන් පැහැදිලි වේ. විමසීමෙන් හා උපායෙනහි දක්ෂව ක්‍රියා කරන්නා ඉතා සුළු දෙයකින් පවා දියුණු වන අයුරු මළ මී කුණක් විකුණා සිටුවරයෙකු වූ පුද්ගලයෙකු ගැන කියවෙන චුල්ලසෙට්ඨි කතා පුවතෙන් විග්‍රහ කෙරේ. එම සිද්ධියම ඇසුරු කොට කුඩා ගිනි පුපුරකින් මහා ගින්නක් මොලවන්නා සේ ඉතා කුඩා දෙයකින් විශාල ධනයක් උපයා ගත හැකි යයි, බුදුරජාණන් වහන්සේ වදාළහ. එසේ කළ යුත්තේ අනුන් තලා පෙලා හිංසා පීඩා කොට අධාර්මික ලෙසින් නොවේ. ධාර්මිකව යෙදූ උපාය ශක්තියෙන් හා විමසීමේ නුවණිනි.

**සංවිධානයෙහි දක්ෂබව**

උට්ඨාන සම්පදාව ඇති කර ගැන්මට අවශ්‍ය සිවු වැනි කරුණ ලෙස ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සඳහන්ව ඇත්තේ සංවිධානයෙහි දක්ෂබවයි. කිනම් කාර්යයකට වුවද පිළිවෙලක්, සංවිධානයක් තිබිය යුතුමය. අසංවිධානාත්මකව සිදු කරන දේ සාර්ථක නොවේ. ජීවිතයේ දෛනික කටයුතු සියල්ලක් ද සංවිධානාත්මකව කළ යුතුය. දින සටහනක් කාල සටහනක් අවශ්‍ය වන්නේ එබැවිනි. බුදුරදුන් පවා එදිනෙදා කටයුතු සිදු කළේ දින චරියාවකට අනුවය.

එබැවින් කිසියම් කාර්යයක් සපල කරගැනීමට නම් සංවිධානශීලී බව ද මැනවින් අත්‍යාවශ්‍යය. මෙම කරුණු දෙස අවධානය යොමු කිරීමේදී ''උට්ඨාන සම්පදාව'' යනු කුමක්ද? එය මෙලොව - පරලොව දියුණුවට හේතුවන්නේ කෙසේද? යන්න පැහැදිලිය. විශේෂයෙන් ගිහි බෞද්ධයන්ට වැදගත් වන මෙම ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි අන්තර්ගත කරුණු මනාව වටහාගෙන ජීවිතය සාර්ථකත්වය කරා ගෙන යාමට සැවොම අදිටන් කරගත යුතුය.